**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - 2016**

**----------------------------------------------------**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2017 ජූලි 12 වැනි දින අධිකාරියේ සභාපති වෙත නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි .

2. **මූල්‍ය ප්‍රකාශන**

-------------------

2.1 **මතය**

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------------

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් අධිකාරිය වෙත 2014 ජුලි 16 දින පවරා දෙන ලද මෝටර් රථ දෙකෙහි වෙළඳපල අගය තක්සේරුකර ගිණුම්ගතකිරීම වෙනුවට රු.282,448 ක ආනයන බදු මුදල පමණක් මෝටර් රථ ගිණුමට හර කර තිබුණි. එහෙයින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

2.3 **ලැබිය යුතු ගිණුම්**

----------------------

2016 දෙසැම්බර් 31 දිනට මිලදී ගැනීම්වලට අදාලව අධිකාරියට ලැබිය යුතු එකතු කළ අගය මත වූ යෙදවුම් බදු වටිනාකම රු.59,504,356 ක් විය. මෙම මුදල අයකර ගැනීම පිළිබඳ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පැවතිය ද මෙතෙක් අවසාන නිගමනයකට එළැඹී නොතිබුණි. මේ හේතුවෙන් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිත විය.

2.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------------------

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ 9 වන වගන්තිය | දෙවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ගගන යාත්‍රාංගන සහ තුන්වන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ගගන නාවික පහසුකම් සහ ඒ ගගන යාත්‍රාංගන වලට ආබද්ධ ඉඩම්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අධිකාරිය වෙත පවරා සතුකර දෙනු ලැබිය හැකි වුවත්, එසේ පවරා සතුකර දිය යුතුව තිබූ උපලේඛනයේ දැක්වෙන විෂයයන් හඳුනාගෙන පවරා ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) අධිකාරියේ කාර්ය මණ්ඩල හා පරිපාලන රීති සංග්‍රහයේ 11.2.6 වගන්තිය | ජාත්‍යන්තර සමුළුවකට, රැස්වීම්වලට, වැඩමුළුවකට හෝ පුහුණුවීමකට සහභාගිවීමෙන් ලබන විෂය කරුණු හා ප්‍රයෝජන අධිකාරිය නියෝජනය කරමින් සහභාගි වූ නිලධාරියා විසින් ආපසු පැමිණ දින 30 ක් ඇතුලත එම විෂය කරුණුවලට සම්බන්ධව කටයුතු කරන සියළුම නිලධාරීන් තනිව හෝ එක්වගෙන පැහැදිලි කර එසේ සිදුකල බවට ලිඛිත වාර්තාවක් තබාගත යුතු වුවත් අධිකාරිය එම ක්‍රියාමාර්ගය අනුගමනය කර නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.5 වගන්තිය | අධිකාරියට ලැබිය යුතු හා ගෙවිය යුතු දැ වල වයස් විශ්ලේෂණ වාර්තාවක් මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කලයුතු වුවත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2016 පෙබරවාරි 10 දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළැඹි තීරණය අනුව ආසියා ශාන්තිකර කලාපයේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ 53 වන සම්මේලනයෙහි සත්කාරත්වය දැරීමේ පිරිවැය වශයෙන් රු.මිලියන 20 ක මූල්‍යමය උපරිමයකට යටත් වියදම් ප්‍රමාණයක් අධිකාරියේ අරමුදලින් දැරීමට අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද, අනුමත මුදල ඉක්මවා රු.මිලියන 2.3 ක් අධිකාරියේ අරමුදලින් දරා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 881ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 871 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 10 ක වර්ධනයක් නිරීක්ෂණය විය. කාර්ය මණ්ඩල, පරිපාලන හා වෙනත් වියදම් රු. මිලියන 63 කින් වැඩි වුවද මෙහෙයුම් හා මෙහෙයුම් නොවන ආදායම රු. මිලියන 81 කින් වැඩිවීම නිසා මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ දී රු.මිලියන 523.4 ක් වූ අතිරික්තය 2016 වර්ෂයේ දී රු.මිලියන 881.1 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. අධිකාරියේ අතිරික්තයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසුව 2012 වර්ෂයේ දී රු.මිලියන 792.8 ක් වූ දායකත්වය 2016 වර්ෂයේ දී රු.මිලියන 1,493.4ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ මුළු ආදායම රු.මිලියන 1,660 ක් වූ අතර එය 2015 වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 81 ක හෙවත් සියයට 5 ක වර්ධනයකි. මුළු ආදායමින් රු.මිලියන 1,233 ක් හෙවත් සියයට 74ක්ම දායකත්වය ලබා දී තිබුණේ ඍජු ප්‍රයත්නයක් නොමැතිව ජනිත වූ විදේශීය විකුණුම් අධිහාරය මගිනි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ ප්‍රමාණාත්මක අනුපාත හා ප්‍රතිශතයන් පහත දැක්වේ.

| | **2016** | **2015** |
|---|---|---|
| පිරිවැටුමට ශුද්ධ ලාභ අනුපාතය | 53% | 55% |
| පිරිවැටුමට සේවක මණ්ඩල පිරිවැය | 14% | 12% |
| ජංගම අනුපාතය | 2.8:1 | 3.1:1 |

පිරිවැටුමට සේවක මණ්ඩල පිරිවැය 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ දී අඩුවීමක් පෙන්නුම් කල ද එය 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රමයෙන් වැඩිවන බවක් නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කාර්යසාධනය**

----------------

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත අනුව නිරුපද්‍රිතා හා සුරක්ෂිතතා ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කලින් නියම කළ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම හෝ ඒවා අභිබවා යෑම, යෝග්‍ය පරිදි සම්පත් සපයා ගැනීම, වෘත්තීයභාවයට හා නිපුණත්වයට පත්වීම, පුළුල් විශ්වනීයත්වයක් සහ පිළිගැනීමක් ලබා ගැනීම, අධිකාරියේ කාර්යසාධනය තිරසාර ලෙස පවත්වා ගැනීම හා වැඩිදියුණු කිරීම, සෑම ක්‍රියාවක්ම ඉහලම මට්ටමේ ඵලදායිතාවයකින් යුක්තව ඉටු කිරීම,අන්තර්ජාතික ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් සඳහා ඉහළම අනුකූලතාවක් දැක්වීම හා සිවිල් ගුවන් සේවා කටයුතු සැලසුම්කරණය හා සංවිධානය කිරීම සඳහා ශක්තිමත් පහසුකම් සපයන්නෙකු වීම ආයතනයේ අරමුණ විය.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ සඳහන් කාර්යයන් හා කර්තව්‍ය තුල අන්තර්ගත පහත සඳහන් කාර්යයන් සමාලෝචිත කාල පරිච්ඡේදය තුල ඉටුකර නොතිබුණි.

(i) ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තිය සකස් කර ගැනීම සඳහා අධිකාරිය අමාත්‍යවරයාට සහාය විය යුතු බැවින් වසර කිහිපයකට පෙර ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තියක් සැකසීම සඳහා අධිකාරිය විසින් මූලික කටයුතු ආරම්භ කර තිබු නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විටත් එය කෙටුම්පත් මට්ටමේ පැවතුනි.

(ii) ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තිය සකස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ශ්‍රී ලංකාව සඳහා ගුවන් සේවා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

(ආ) ගුවන් සේවා සුරක්ෂිතතා අංශයේ කාර්යසාධනය

-----------------------------------------------------

අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව අනුව අධිකාරියේ ගුවන් සේවා සුරක්ෂිතතා (Aviation Security) අංශය තුල අධ්‍යක්ෂවරයා ඇතුළුව 8 දෙනෙකු සිටිය යුතුය. ඊට අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂකවරු 2 දෙනෙක් හා සිවිල් ගුවන් සේවා පරීක්ෂකවරු 5 දෙනෙක් අයත් වෙති. 2016 දෙසැම්බර් 31 දින වන විට අදාල තනතුරුවලින් සේවයේ නියුක්ත කර තිබුණේ එක් ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂකවරයෙක් හා එක් සිවිල් ගුවන් සේවා පරීක්ෂකවරයෙකු පමණි. සමාලෝචිත වර්ෂයේ දී නවක ගුවන් සේවා පරීක්ෂකවරුන් 4 දෙනෙකු බඳවාගෙන තිබුණ ද ඔවුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට වාර්ෂික පුහුණු කාලයක් සැලසිය යුතු විය. එහෙයින් නිලධාරින් 07 දෙනෙකු

විසින් ඉටුකලයුතු කාර්යයන් නිලධාරීන් 02 දෙනෙකු විසින් ප්‍රායෝගිකව ඉටු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4ක් සඳහා වූ සෝදිසි කාර්යයන්හි (Surveillances) ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ගුවන් සේවා සුරක්ෂිතතා (Aviation Security) අංශය විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තුල 2015 හා 2016 වර්ෂයන්ට අදාලව කළයුතුව තිබූ පිරික්සුම් ගණන පිළිවෙලින් 26 ක් හා 31 ක් බව වාර්ෂික පරීක්ෂණ සැලැස්මේ සඳහන්ව තිබුණ ද තථ්‍ය වශයෙන් ක්‍රියාත්මක කර තිබූ පිරික්සුම් ගණන පිළිවෙලින් 18 ක් හා 24ක් විය.

(ii) පරීක්ෂා (Test) වලට අදාලව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එක් වර්ෂයකට පරීක්ෂා 04 ක් බැගින් සැලසුම් කර තිබුණ ද අදාල වර්ෂයන් තුල ඉටුකර තිබුණේ එයින් එක් පරීක්ෂාවක් බැගින් පමණි.

(iii) 2014 වර්ෂයේ අභ්‍යන්තර මෙහෙයුම් පරීක්ෂණ හා රාත්‍රී පරීක්ෂණ පිළිවෙලින් 06 ක් හා 04 ක් සැලසුම් කර තිබුණ ද එයින් තථ්‍ය ලෙස ක්‍රියාත්මක කර තිබුණේ පරීක්ෂණ 2ක් බැගින් පමණි. 2014 වර්ෂයෙන් පසුව අදාල පරීක්ෂණ සැලසුම් කර නොතිබුණි.

(iv) 2015 හා 2016 වර්ෂයේ දී මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ හි සිදුකිරීමට සැලසුම්කල පරීක්ෂණ ගණන පිලිවෙලින් 12ක් හා 4ක් වූ අතර තත්‍ය වශයෙන් ඉටු කළ පරීක්ෂණ ගණන 6ක් හා 1ක් විය. ඒ අනුව 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සැලසුම්ගත හා සත්‍ය පරීක්ෂණ ගණනේ අඩුවීමක් දක්නට ලැබුණි.

(ඇ) ගුවන් සංතරණ සේවා (Air Narigation Services) අංශයේ කාර්යසාධනය
-------------------------------------------------------------------------------------

මෙම අංශයේ 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සෝදිසි පරීක්ෂණ කටයුතු සැලසුම් කිරීම් (Surveillance Plan) සහ එම සැලසුම් ඉටුකර ගැනීම පරීක්ෂා කිරීමේ දී 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයේ දී ගගන නාවික තොරතුරු සේවා පරීක්ෂණ (AIS) ක්‍රමිකව අඩුවන පරිදි සැලසුම් කිරීමක් හා ක්‍රියාත්මකවීමක් දක්නට ලැබුණි.

(ඈ) ගගන යාත්‍රාංගන අංශයේ කාර්යසාධනය (Aerodrome)
--------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4කට අදාලව සිදුකරන ලද සෝදිසි පරීක්ෂණ (Surveillance) අනුව 2016 වර්ෂය තුල කටුනායක , මත්තල හා රත්මලාන යන ගුවන් තොටුපළ පරීක්ෂණ (Surveillances) 24 ක්, 06 ක් හා 06 ක් ලෙස මුළු පරීක්ෂණ 36 ක් සිදුකල යුතු වුවත් 2016 වර්ෂයේ දී කටුනායක, මත්තල හා රත්මලාන යන ගුවන් තොටුපළ පිළිවෙලින් පරීක්ෂණ 20 ක්, 05 ක්, හා 04 ක් සිදුකර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ තථ්‍ය ලෙස ඉටුකල පරීක්ෂණ වල අඩුවීමක් පැවති බව නිරීක්ෂණය විය.

(ඉ) ගුවන් සේවා යෝග්‍යතා (Airworthiness) අංශයේ කාර්යසාධනය
-------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(i) ගුවන් සේවා යෝග්‍යගයතාවය තහවුරු කිරීමට 2016 වර්ෂයේ සැලසුම්කල පරීක්ෂණ 215 න් පරීක්ෂණ 42 ක් හෙවත් සියයට 19 ක් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

(ii) 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය සලකා බැලීමේ දී, ගුවන් පරීක්ෂණ පැවැත්වීමේ ප්‍රතිපත්තියේ සිදු වූ සමාලෝචනය හේතුවෙන් අධිකාරියේ ගුවන් යෝග්‍යතා (Airworthiness) අංශය විසින් සිදුකරන ලද පරීක්ෂණ සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ අඩුවීමක් දක්නට ලැබුණි.

(ඊ) ප්‍රධාන මෙහෙයුම් අංශයේ කාර්යසාධනය

-----------------------------------------------

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරේ අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් අංශයේ කාර්යසාධනය පිළිබඳ අධ්‍යයනයේ දී වසරින් වසර ක්‍රමිකව ශ්‍රී ලංකාවට පැමිණෙන ගුවන් යානා සහ ගුවන් මෙහෙයුම් වැඩි වී තිබූ නමුත් සිවිල් ගුවන් සේවා නියාමනයට අදාල පරීක්ෂණවල ප්‍රගතියේ වර්ධනයක් දක්නට නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) අධිකාරිය විසින් ආසියා ශාන්තිකර කලාපයේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ 53 වන සම්මේලනය සඳහා රු.මිලියන 13 ක මුදලක අනුග්‍රාහකයින්ගෙන් ලබා ගැනීමට අපේක්ෂා කල ද ලැබී තිබුණේ රු.මිලියන 9 ක මුදලක් පමණි. ඒ අනුව රු.මිලියන 4 ක මුදලක් අනුග්‍රාහකයින්ගෙන් අධිකාරිය වෙත ලබාගැනීමට 2016 දෙසැම්බර් 31 දිනතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂය තුල ඉදිකිරීම් නිමකර දේශීය ගුවන් ගමන් සිදුකිරීමට අපේක්ෂා කළ මඩකලපුව ගුවන් තොටුපළෙහි ඉදිකිරීම් 2016 ජුනි 24 දින අවසන් කර ගුවන් හමුදාව විසින් ගුවන් ගමන් සඳහා යොදාගත හැකි බව අධිකාරිය වෙත දන්වා තිබුණ ද 2017 මාර්තු මස වනතෙක්ම එය විවෘත කර ගුවන් ගමන් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. තවද මෙහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම දරා තිබූ රු.18,973,363 ක වියදම ප්‍රවාහන අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඇ) 2003 අංක 25 දරන මුදල් **පනත අනුව ඩොලරයේ හුවමාරු අගය භාණ්ඩාගාර අනුමැතියට යටත්ව තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරී තිබුණි.** 2015 හා 2016 වර්ෂයන්ට අදාලව වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය ඩොලර් එකක් සඳහා පිළිවෙලින් රු.135.18 ක් හා රු.145.93 ක් වී තිබියදී අපගමන බද්ද අයකිරීමේ දී ඩොලර් එකක් සඳහා පිළිවෙලින් රු. 130 ක් හා රු. 140 ක් ලෙස ගණනය කිරීම හේතුවෙන් 2016 අප්‍රේල් මාසයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා අපගමන බදු ගෙවා තිබූ ටිකට්පත් 2,524,216 ක් සම්බන්ධයෙන් රු.446,886,322 ක් ආදායම අඩුවෙන් ගණනය වී තිබුණි. තවද අපගමන බද්ද අය කිරීමට අදාල විනිමය අනුපාතය පිළිබඳව 2015 ඔක්තෝබර් 26 දින අවසන් වරට තීරණය කර තිබූ අතර එය ඩොලර් එකක් සඳහා රු. 140 ක් විය. ඉන්පසු විනිමය අනුපාතය වෙනස් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඈ) 2003 අංක 25 දරන මුදල් පනතේ පළමු කොටසේ 2(1) වගන්තිය පරිදි නිකුත් කර තිබූ නියමය අනුව 2017 ජනවාරි හා පෙබරවාරි මාස සඳහා අයකළ යුතු අපගමන බද්ද ලෙස මුදල් අමාත්‍යවරයා නිර්දේශකර තිබූ වටිනාකම එක් ටිකට්පතකට ඇ.එ.ජ. ඩොලර් 50 ක් විය. එහිදී ඩොලර් එකක් සඳහා රුපියල් වටිනාකම ලෙස රු. 140 ක් අයකර තිබුණි. එහෙත් 2017 ජනවාරි හා පෙබරවාරි සඳහා සාමාන්‍ය විනිමය අනුපාතය රු. 150.45 කි. අපගමන බදු අය කිරීමේ දී වෙළඳපල විනිමය අනුපාතය භාවිතා නොකිරීම හේතුවෙන් 2017 ජනවාරි හා පෙබරවාරි මාසයන්හි එක් ටිකට්පතකින් අයකළ බද්ද රු. 522 කින් ඌන ගණනය වී තිබුණි. ඒ හේතුවෙන් අදාල මාස 2ක තුල අලෙවි කළ ගුවන් ටිකට්පත් 658,452 ක් සම්බන්ධයෙන් පමණක් අඩුවෙන් එකතු කර තිබූ බදු වටිනාකම ආසන්න වශයෙන් රු. 272,732,919 ක් විය.

(ඉ) 2011 පෙබරවාරි 10 දිනැති අංක 420 දරන ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුමෙහි 20 වෙනි වගන්තිය අනුව මුල් ගිවිසුම අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වන බව දක්වා තිබුණි. බදුකරු නැවත වසර දෙකක කාලයක් සඳහා ගිවිසුම දීර්ඝ කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ගිවිසුම අළුත් කලයුතු බව දක්වා තිබුණ ද මුල් ගිවිසුම අත්සන් කර වර්ෂ 6 ක් ගත වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල ගිවිසුම අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2010 වර්ෂයේ දී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) නිකුත් කරන ලද රාජ්‍ය නිරුපද්‍රිත සංක්ෂිප්ත වාර්තාව අනුව, රටවල් 191 ක් අතුරින් ශ්‍රී ලංකාව 19 වන ස්ථානයට පත් වී තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් සාමාජික රටවල් අරඹයා සිදුකරන නිරුපද්‍රිතතා විගණනය 2018 ජූනි 04 දින සිට 14 දක්වා සිදුකිරීමට යෝජනා වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) 2010 වර්ෂයේ සිදුකල විගණනයේ දී අධිකාරියේ එක් එක් අංශයන්ට අදාලව නිවැරදි කරගත යුතු දුර්වලතා 80 ක් නිවැරදි කර ගැනීමට නිර්දේශ කර තිබුණි. නියැදි විගණන පරීක්ෂාවේ දී ගුවන් යාත්‍රාංගන අංශයට අදාලව ඉදිරිපත් කර තිබූ ප්‍රධාන දුර්වලතා 7න් 3කට අදාලව කලාපයේ රටවල් සමග එකඟතා ගිවිසුමක් අත්සන් කිරීම, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම අතර විධිමත් නීත්‍යානුකූල ගිවිසුමක් ඇතිකර ගැනීම සහ කාලගුණ දත්ත සපයන සංවිධාන ගුණාත්ව ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් නිගමනවලට එළැඹ නොතිබුණි.

(ආ) අධිකාරියේ සියළු මෙහෙයුම් කාර්යයන් ආවරණය වන පරිදි අංග 13 ක් හඳුනාගෙන ඊට අනුරූපී ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (Key performance Indicators ) හඳුන්වා දී තිබූ නමුත් ඊට අනුකූල වන ආකාරයට කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2015 අප්‍රේල් 09 වන දිනැති අංක ඩීඑම්එස් /1748 දරන කළමනාරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය පරිදි අධ්‍යක්ෂ, ගුවන් සංතරණ සේවා (Air Navigation) තනතුරේ සේවය කරන නිලධාරීන් තිදෙනෙකුට අදාල තාක්ෂණික දීමනා ලබා ගැනීම සඳහා වානිජ ගුවන් නියමු (Commercial Pilot) බලපත්‍රය (Fixed Wing/Rotary wing) පැවතීම අවශ්‍ය වුවත්, එම බලපත්‍රය නොමැතිව ගුවන් ගමන් පාලක (Air Traffic Controller) බලපත්‍රය සඳහා එම නිලධාරීන්ට 2016 වර්ෂය තුල දී පිළිවෙලින් මාසයකට රු.235,000 ක්, රු.130,000 ක් හා රු.225,000 බැගින් මාස 12ක් සඳහා එකතුව රු.7,080,000 ක මුදලක් තාක්ෂණික දීමනා වශයෙන් ගෙවා තිබුණි.

## 4.5 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

ඇස්තමේන්තුගත පිරිවැය රු.803,369,988 ක් වූ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2015 දෙසැම්බර් මාසයේ දී ඉදිකිරීම ආරම්භකර තිබූ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට සියයට 76 ක භෞතික ප්‍රගතියක් හා රු.610,561,191ක මූල්‍ය ප්‍රගතියක් අපේක්ෂා කර තිබුණ ද එදින වන විට භෞතික ප්‍රගතිය සියයට 38 ක් හා මූල්‍ය ප්‍රගතිය රු.305,280,595 ක් පමණක් වීමෙන් අපේක්ෂිත මට්ටමට ලගා වී නොතිබුණි. කොන්ත්‍රාත්කරු විසින් 2017 ජූනි 13 දින අවසන් කිරීමට නියමිතව පැවති මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ඉතාමත් මන්දගාමී ලෙස සිදුකර ගෙන යන බව අනාවරණය වී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත 2017 ජූනි 7 දිනැති අංක අමප/17/1019/709/041 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව අදාල කොන්ත්‍රාත් කාල සීමාව 2017 සැප්තැම්බර් 30 දක්වා තවත් මාස 3 ½ ක කාලයක් දීර්ඝ කිරීම හේතුවෙන් අධිකාරිය දැනට භාවිතා කරනු ලබන ගොඩනැගිල්ලට මාසිකව රු.3,727,386 ක් බැගින් එම කාලයට අදාලව රු.13,045,851 ක අමතර කුලියක් ගෙවීමට සිදුවිය හැකිය. මෙම මුදල කොන්ත්‍රාත් ඉදිකිරීම ප්‍රමාදවීම මත අමතර වශයෙන් අධිකාරියට ගෙවීමට සිදුවන පිරිවැයක් ලෙස විගණනයේ දී නිරීක්ෂණය විය.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

අධිකාරිය සතු රු.324,000 ක් වටිනා මුද්‍රණ යන්ත්‍ර 3ක් හා පරිගණක යන්ත්‍ර 3ක් 2011 වර්ෂයේ දී රේඛීය අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

වසර ගණනාවක සිට අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු 02ක් ද විධායක මට්ටමේ නිළධාරි තනතුරු 08ක් ද ලෙස පුරප්පාඩු තනතුරු එකතුව 10ක් පැවතුණි. අධිකාරිය තුළ සේවක මණ්ඩලයේ නිලධාරින් සඳහා උසස්වීම් ලබාදීම මගින් හෝ නව බඳවා ගැනීම් මගින් ඉහත පුරප්පාඩු පුරවනු වෙනුවට කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරින් 10 දෙනෙකු බඳවාගෙන සේවයේ යොදවා තිබුණි. 2016 වර්ෂය සඳහා ඔවුන් වෙනුවෙන් එකතුව රු. 30,857,888 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත් මෙම නිලධාරින්ගේ සේවා කාලය වසරින් වසර දීර්ඝ කරමින් පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කර තිබුණද ස්ථිර පදනමින් නිළධාරීන් බඳවාගැනීමෙන් හා ආයතනය තුලින් පුහුණු කිරීම මගින් නිලධාරින් අදාල තනතුරු සඳහා යොමු කරවීමට කටයුතු කර නොතිබුණි. මෙම තත්ත්වය අධිකාරියේ ඉදිරි පැවැත්මට අහිතකර ලෙස බලපාන බව විගණනයේ අදහසයි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තථ්‍ය ආදායම්, වියදම් අතර සියයට 36 සිට සියයට 64 දක්වා පරාසයක සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී අනාවරණය වු පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ප්‍රත්‍යාගණනය නොකිරීම, පරිසනක ලේඛනය යාවත්කාලීන නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | ඉහල අගයක විචලතාවයන් පැවතීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | ස්ථිර පදනමට නොමැතිව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සිදුකර තිබීම. |
| (ඈ) | ගිණුම්කරණය | ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතාවයන් ඉටු නොකිරීම. |